ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම
2 වන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2006/2007

දීලික්ත නීතිය - **LWU 4326/3326**

කාලය - විනාඩි 40 යි

---

දිනය - 2006.11.10 වේලාව - ප.ව.03.00 - ප.ව.03.40 දක්වා

---

*<u>එක් ප්‍රශ්නයකට</u> පමණක් පිළිතුරු සපයන්න.*
*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

01. (අ) මලිත් පරිගණකයක් මිලදී ගැනීමට තීරණය කරයි. මලිත්ට පරිගණක පිළිබඳ දැනුමක් නොමැති නිසා ඔහු, පරිගණක ආයතනයක දත්ත සැකසුම් කළමනාකරුවෙකු වශයෙන් සේවය කරන ඔහුගේ මිතුරකු වූ නිකිල්ගේ උපදෙස් පතන ලදී. නිකිල්, මලිත්ට **NMB** පරිගණකයක් මිලදී ගැනීමට උපදෙස් දුනි. නිකිල්ගේ නිර්දේශය පරිදි මලිත් සියළුම උපාංග සහිතව **NMB** පරිගණකයක් මිලට ගන්නා ලදී.

පරිගණකය සවි කිරීමෙන් පසුව එය නිසි පරිදි ක්‍රියා නොකරන බව හෙළි විය. එහෙයින් මලිත් පරිගණකයේ ක්‍රියාකාරිත්වය සොයා බැලිමට පරිගණක විශේෂඥයකු වූ අසිත ගේ සේවය ලබා ගත්තේ ය. අසිත, මලිත්ට ප්‍රකාශ කරන ලද්දේ පරිගණකයේ මධ්‍යම සැකසුම් ඒකකය **(central processing unit)** කිහිප වතාවක් අළුත්වැඩියාවට භාජනය වූ ඉතා පැරණි පරිගණකයක් බවයි. එමෙන්ම පරිගණකයේ ආයු කාලය දැනටමත් අවසන් වී ඇති බව අසිත, නිකිල්ට පවසා සිටියේ ය.

නිකිල් ඇත්ත වශයෙන් ම දත්ත සැකසුම් කළමනාකරුවකු නොව පරිගණක ආයතනයට අනුබද්ධ අලෙවි නියෝජිතයෙක් **(sales representative)** බව පසුව මලිත්ට දැන ගන්නට ලැබුණි.

නිකිල්ට එරෙහිව වන්දි සඳහා නඩු පැවරීමට මලිත්ට හැකි ද?

(ආ) කේෂානි රූපාලංකාර ද්‍රව්‍ය අලෙවි හලක හිමිකාරිය වේ. කේෂානි නිත්‍ය ගණුදෙනුකාරියක වූ නයෝමි , ඇයගේ විවාහයට අවශ්‍ය රූපාලංකාර ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මිලදී ගන්නා ලදී. නයෝමිගේ විවාහයට දින දෙකකට ප්‍රථම ඇය මුහුණට ආලේපනයක් භාවිතා කරන ලද අතර එසැනින්ම ඇයට මුහුණේ කිසියම් අපහසුතාවයක් දැනෙන්නට විය. ටික වේලාවකින් පසු මුහුණේ සෑම තැනම රතු පැහැති ලප මතු වන්නට විය. එම මුහුණ ආලේපනය නිෂ්පාදනය කිරීමේ දී භාවිතා කරන එක්තරා රසායනික ද්‍රව්‍යයක සාමාන්‍ය අනුපාතය නිෂ්පාදන ආයතනය විසින් වැඩි කර ඇති බව පසුව සොයා ගන්නා ලදී. මෙම මුහුණ ආලේපනය කලින් පරීක්ෂාවට ලක් කලේ නම් මෙම දෝෂය සොයා ගැනීමට හැකියාවක් තිබුණි.

නයෝමිට උපදෙස් දෙන්න.

02. "නොසැලකිල්ල පිළිබඳ නඩුකරයකදී අවධානය කැමැත්තෙන්ම භාර ගැනීම (***volenti non-fit injuria)*** පිළිබඳ රක්ෂණයේ ක්ෂේත්‍රය ඉතා පටු වී ඇති නිසා එහි වටිනාකම ප්‍රමාණාත්මක ලෙස අඩු වී ඇත."

මෙම ප්‍රකාශය, මෙම ගැටළුව සම්බන්ධයෙන් ඇති මෑතකාලීන නඩු තීන්දු අදාල කරගෙන සාකච්ඡා කරන්න.

- හිමිකම් ඇවිරිණි.-